මෙය පසුගිය වර්ෂයේ වැඩි වීමට වඩා අඩුය. පොල් නිෂ්පාදන සඳහා වර්ෂයේ පළමු කාර්තුවෙහි තිබූ ඉහළ මිළ මෙම වර්ධනයට දායක වුවත්, අවසාන කාර්තු තුනෙහි වූ අඩු මිළ නිසා 1984 දෙසැම්බර් හා සැසඳීමේදී දර්ශකයේ සියයට 2.2 ක වර්ධනයක් පමණක් ඇති කිරීමට සමත් විය.

පසුගිය වර්ෂයේ සියයට 5.9 ක වැඩි වීම හා සැසඳීමේදී දේශීය ගණයේ උප දර්ශකය සියයට 11.3 කින් ඉහළ නැඟුණි. විවෘත වෙළෙඳපොලේ වී, වියළි මිරිස්, එළවළු සහ රතුළූනු මිළ වැඩි වීම දර්ශකයේ මෙම වඩා තියුණු වූ ඉහළ නැගීමට දායක විය. 1983 සියයට 10.2 හා සැසඳීමේදී ආනයන ගණයේ උප දර්ශකය 1984 දී වැඩි වූයේ සියයට 6.3 ක් වූ අඩු ප්‍රමාණයකිනි.

භාණ්ඩ අනුව සැළකීමේදී ආහාර උපදර්ශකය එමගින් පාලනය කරනු ලබන මුළු දර්ශකයේ හැසිරීම් රටාවට සමාන බවක් පෙන්වීය. ආහාර උප දර්ශකයේ වැඩි වීමේ සාමාන්‍යය පසුගිය වර්ෂයට වඩා සියයට 33 කි. එහෙත් 1984 දෙසැම්බර්, 1983 දෙසැම්බර් හා සැසඳීමේදී වැඩි වීම සියයට 4.7 ක් පමණි.

ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වූ උප දර්ශකය 1983 මිළ සාමාන්‍යය හා සැසඳීමේදී සියයට 12.5 කින් වැඩි වුවද, මෙම උපදර්ශකය ඛනිජ තෙල් මිළ එකම තත්ත්වයේ තිබූ නිසා වර්ෂය පුරාම නොවෙනස්ව පැවතුණි. පසුගිය වර්ෂය හා සැසඳීමේදී විවිධ අයිතමයන්ගේ මිළ වැඩි වීම අඩුවෙන්ද ලෝහ හා ලෝහ නොවන අයිතමයන්ගේ මිළ වැඩි වීම වැඩියෙන්ද සිදුවිය.

## වැටුප්

1984 වර්ෂයේදී සංවිධානය වූ හා සංවිධානය නොවූ අංශ දෙකෙහිම සේවක වැටුප් වැඩි විය. කෙසේ වුවද, සංවිධානය වූ අංශයේ වැටුප් පෙර වර්ෂයට වඩා අධික ප්‍රමාණයකින් වැඩි විය. රාජ්‍ය අංශයේ විවිධ කාණ්ඩවල සේවකයින් සඳහා වූ වැටුප් වැඩිවීම පෙර වර්ෂය හා සමාන විය. 1984 අප්‍රේල් මාසයේදී වැවිලි අංශයේ සේවක වැටුප්වල සිදුවූ සැළකිය යුතු වැඩිවීම හා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම සම වැටුප් ප්‍රමාණයන් ඇති කිරීම වර්ෂය තුළ වැටුප්වල සිදුවූ වැදගත් වෙනස්වීම් ලෙස සටහන් කළ යුතුය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, පඩිපාලක සභා මගින් ආවරණය වන කර්මාන්තයන් අතුරින් කෘෂිකර්ම අංශයේ සේවක වැටුප් තිව්‍ර ලෙස වැඩි විය. පඩිපාලක සභා මගින් ආවරණය වන අනිකුත් කර්මාන්ත අංශයන්හි සේවක වැටුප් වැඩි වූයේ මඳ වශයෙනි. සංවිධානය නොවූ අංශයේ, තේ හැර අනෙකුත් සියළුම උප අංශයන්හි මූල්‍ය වැටුප් වැඩි වූයේ පෙර වර්ෂයට වඩා අඩු ප්‍රමාණයකිනි.


රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා වූ ජීවන වියදම් ගැලපුම් දීමනාව 1983 සැප්තැම්බර් මාසයේ සිට රු. 246.00 ක් වශයෙන් ස්ථායීව තිබූ අතර, 1984 මාර්තු මාසයේදී එය විමර්ශණය කරන ලදුව තවත් රු. 102.00 ක අතිරේක දීමනාවක් ගෙවීමට තීරණය කරන ලදී. කෙසේ වුවද, අවිවාහක හෝ, කලත්‍රයන් රාජ්‍ය අංශයේ, බැංකු, රාජ්‍ය සංස්ථා,සංස්ථාපිත මණ්ඩල හෝ ජීවන වියදම් දීමනා ගෙවනු ලබන පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත නම්, ඔවුන්ට හිමිවූයේ ජීවන වියදම් ගැලපුම් දීමනාවෙන් හරි අඩක් බැගින් පමණය. අනතුරුව, 1984 සැප්තැම්බර් මාසයේ, 1984 අගෝස්තු මාසයේ දර්ශකය මත පදනම් කර තවත් රු. 56.00 ක් ජීවන වියදම් ගැලපුම් දීමනාවට එකතු කරන ලදී. 1984 වර්ෂයේදී ජීවන වියදම් ගැලපුම් දීමනාවේ මුළු වැඩිවීම රු. 158.00 ක් විය.

1984 අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය වැවිලි සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය තේ වගා හා නිෂ්පාදන අංශයේ සේවකයින් සඳහා රු. 23.78 ; රබර් වගා හා නිෂ්පාදන අංශය රු. 23.93 ; පොල් වගා හා නිෂ්පාදන අංශය රු. 19.90 ක් වශයෙන්ද වැටුප් වැඩි කිරීමෙන් ගැහැණු හා පිරිමි වැටුප් සමාන කරන ලදී. කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වගා හා නිෂ්පාදන අංශයේ, ගැහැණු හා පිරිමි, වැටුප්ද රු. 18.80 ක් වනසේ වැඩි කරන ලදී. මේ අනුව 1984 මාර්තු මාසය හා සැසඳීමේදී තේ වගා හා නිෂ්පාදන අංශයේ පිරිමි හා ගැහැණු

# වැටුප් ප්‍රමාණ දර්ශක අංක

1978 දෙසැම්බර් = 100

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

වැටුප්, අප්‍රේල් මාසයේදී පිළිවෙලින් සියයට 30 කින් හා සියයට 56 කින් වැඩි විය. රබර් වගා හා නිෂ්පාදන අංශයේ ගැහැණු හා පිරිමි වැටුප්වල අදාල වැඩිවීම පිළිවෙලින් සියයට 19 ක් හා සියයට 39 ක් විය. ඒ ආකාරයෙන්ම පොල් වගා හා නිෂ්පාදන අංශයේ ගැහැණු හා පිරිමි වැටුප් පිළිවෙලින් සියයට 25 කින් හා සියයට 46 කින් වැඩි වූ අතර, කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වගා හා නිෂ්පාදන අංශයේ ගැහැණු හා පිරිමි වැටුප් පිළිවෙලින් සියයට 26 කින් හා සියයට 59 කින් වැඩි විය.

රජයේ සේවකයින් හා පඩිපාලක සභා මගින් ආවරණය වන සේවකයින්ගේ වැටුප් හැසිරීම දක්වෙන අවම වැටුප් ප්‍රමාණ දර්ශකයන් අංක 1.28 දරණ සටහනෙහි දක්වේ.

## 1 . 28 සංඛ්‍යා සටහන

### සංවිධානය වූ අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශක අංක

### 1978 දෙසැම්බර් = 100

| සංවිධානයවූ අංශය | වැටුප් ප්‍රමාණ දර්ශකය | | වෙනස අංක වලින් | වෙනස ප්‍රති-ශතයකින් |
|---|---|---|---|---|
| | 1983 | 1984 | | |
| 1. වැටුප් පාලක සභා කර්මාන්තයන්හි කම්කරුවන් .. | 188·8 | 224·3 | 35·5 | 18·8 |
| i කෘෂිකාර්මික කම්කරුවන් .. | 198·7 | 250·2 | 51·5 | 25·9 |
| ii කාර්මික හා වානිජ කම්කරුවන් .. | 163·1 | 168·3 | 5·2 | 3·2 |
| iii සේවා අංශයේ කම්කරුවන් .. | 177·8 | 179·7 | 1·9 | 1·1 |
| 2. සියළුම රජයේ සේවකයන් .. | 215·7 | 246·6 | 30·9 | 14·3 |
| i සියළුම විධායක නොවන රජයේ නිලධාරීන් | 204·6 | 231·4 | 26·8 | 13·1 |
| ii සියළුම සුළු සේවකයන් .. | 226·2 | 260·9 | 34·7 | 15·3 |
| 3. රජයේ පාසැල් ගුරුවරුන් .. | 188·1 | 211·4 | 23·3 | 12·4 |

මූලයන්: කම්කරු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

පාසැල් ගුරුවරුන් හැර රජයේ සේවක වැටුප් ප්‍රමාණ දර්ශකයන්ගේ 1983 වර්ෂයේ සියයට 14.9 ක්වූ වැඩිවීම හා සැසඳීමේදී 1984 වර්ෂයේදී වැටුප් වැඩි වූයේ සියයට 14.3 කිනි.

පසුගිය වර්ෂයේ මෙන් සුළු සේවක වැටුප් ඉහළම ප්‍රමාණයකින් වැඩි විය. (15.3) එසේ වුවද මෙය 1983 වර්ෂයේදී වූ වැඩි වීමට වඩා අඩුය. විධායක නොවන නිලධාරීන්ගේ හා පාසැල් ගුරුවරුන්ගේ වැටුප් පිළිවෙලින් සියයට 13.1 කින් හා සියයට 12.4 කින් වැඩි විය. පසුගිය වර්ෂයේදී සියයට 7.4 ක් වූ වර්ධනය හා සැසඳීමේදී පඩිපාලක සභා මගින් ආවරණය වන සේවක මූල්‍ය වැටුප් 1984 වර්ෂයේදී සියයට 18.8 කින් වැඩි විය. මෙම අධික වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, 1984 අප්‍රේල් මාසයේදී වැවිලි අංශයේ සිදු කරන ලද වැටුප් ප්‍රතිශෝධනයයි. පසුගිය වර්ෂයේ සියයට 9.7 ක් වූ වැඩිවීම හා සැසඳීමේදී කෘෂිකර්ම අංශයේ සේවක මූල්‍ය වැටුප් සියයට 25.9 කින් වැඩිවිය. 1984 දී කර්මාන්ත හා වාණිජ සහ සේවා අංශයන්හි නියුතු සේවක වැටුප් වැඩි වූයේ පිළිවෙලින් සියයට 3.2 කින් හා 1.1 කින් පමණි. 1983 දී අදාල වැටුප් වැඩිවීම පිළිවෙලින් සියයට 1.3 ක් හා 4.8 ක් විය. මේ අනුව අවසාන වශයෙන් නිගමනය කළ හැක්කේ, වැවිලි අංශයේ සේවකයින්ගේ වැටුප් වැඩි වීම හැරුණු විට පඩිපාලක සභාවලින් ආවරණය වන සේවකයන්ගේ වැටුප් 1984 වර්ෂයේදී වැඩි වූයේ මඳ වශයෙන් බවයි.

රජයේ සේවකයන්ගේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකවලින්, පාසැල් ගුරුවරුන්ගේ හැර සියලුම රජයේ සේවක මූර්ත වැටුප්, 1984 වර්ෂයේදී සියයට 2.2 කින් පහත වැටුණු බව පෙන්නුම් කෙරේ. රජයේ පාසැල් ගුරුවරුන්ගේ මූර්ත වැටුප්වල අඩුවීම සියයට 3.9 ක් විය. වැවිලි

අංශයේ පඩි වැඩිවීම නිසා පඩිපාලක සභා කර්මාන්තයන්හි නියුතු සේවකයින්ගේ මූර්ත වැටුප් සියයට 1.5 කින් වැඩි වුණි. කෘෂිකර්මාන්තයේ සේවකයන්ටම පමණක්, සියයට 7.6 ක් මූර්ත වැටුප් වැඩි වීමක් සිදුවිය. 1984 දී කර්මාන්ත හා වාණිජ සහ සේවා අංශයේ නියුතු සේවකයින්ගේ මූර්ත වැටුප් පිළිවෙලින් සියයට 11.6 කින් හා 13.6 කින් පහත වැටුණි.

## වෙළෙඳාම

1984 වසරේදී විදේශ වෙළෙඳාමේ කැපී පෙනෙන වර්ධනයක් ඇති වූයේ තේ සඳහා වූ විදේශ මිළ අධික ලෙස ඉහළ යාමත්, රබර් සහ පොල් සඳහා සාපේක්ෂ වශයෙන් හොඳ මිළක් ලැබීමත්, කාර්මික අපනයනයන්ගෙන් ලත් ඉපැයීම් සැලකිය යුතු ලෙස වර්ධනය වීමත් නිසාය. අපනයන ඉපැයීම් 1984 දී විගැහි වටිනාකම් අනුව සියයට 44 කින් වැඩි වූ අතර පෙර වසරේ වර්ධනය සියයට 7 ක් පමණ විය.

ආනයන වියදම 1984 දී වැඩි වූයේ විගැහි වටිනාකම් අනුව සියයට 0.6 ක තරම් සුළු ප්‍රමාණයකින් වූ අතර 1983 දී එය සියයට 1 කින් පහත වැටී තිබුණි. පාරිභෝජන භාණ්ඩ ආනයන වටිනාකම සියයට 8 කින් අඩු වූ අතර, පොහොර සඳහා වැඩි වියදමක් දැරීමට වූ නිසා අන්තර් භාණ්ඩ ආනයන වියදම සියයට 5 කින් වැඩි විය. ආයෝජන භාණ්ඩ ආනයන සියයට 3 කින් අඩු වුව ද, එය 1983 දී නැව් සහ ගුවන්යානා ආනයනය සඳහා විශාල වියදමක් දැරීම පිළිබිඹු කරන්නක් විය. ඇත්ත වශයෙන්ම, නැව් සහ ගුවන්යානා හැර අනෙකුත් ආයෝජන භාණ්ඩ ආනයන වියදම 1984 දී සියයට 4 කින් වැඩි විය.

### 1.29 සංඛ්‍යා සටහන
### වෙළෙඳ තුලනය 1982 – 1984

රුපියල් දශ ලක්ෂ
(විගැහි දශ ලක්ෂ වරහන් තුළ)

| වර්ෂය | ආනයන (අ) | | අපනයන (ඇ) | | වෙළෙඳ තුලනය | |
|---|---|---|---|---|---|---|
| | රේගු | ගලපන ලද(ඇ) | රේගු | ගලපන ලද | රේගු | ගලපන ලද |
| 1982 | 36,876 (1,605) | 41,946 (1,826) | 21,124 (919) | 21,454 (934) | –15,751 (–686) | –20,492 (–892) |
| 1983 | 42,021 (1,670) | 45,558 (1,811) | 25,183 (1,001) | 25,096 (998) | –16,838 (–669) | –20,461 (–813) |
| 1984(ආ) | 46,913 (1,799) | 47,541 (1,823) | 37,005 (1,419) | 37,347(ඇ) (1,432) | – 9,908 (–380) | –10,194) (–391) |

(අ) සත රන් හා කාසි ඇතුළත් නොවේ.
(ආ) තාවකාලිකයි.
(ඇ) රේගු වාර්තාවේ සඳහන් නොවූ නැව් සහ ගුවන් යානා වටිනාකම් ඇතුලත්ය.
(ඇ) ප්‍රති අපනයන ඇතුළත් වේ.

මූලයන්: ශ්‍රී ලංකා රේගුව,
ආහාර දෙපාර්තමේන්තුව,
ලංකා පොහොර සංස්ථාව සහ වෙනත් ප්‍රධාන ආනයන කරුවෝ,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
රාජ්‍ය මැණික් සංස්ථාව,
සීමාසහිත එයාර් ලංකා,
ලංකා නැව් සංස්ථාව.

ආනයන, ඒවායේ උපයෝජනය අනුව වර්ග කළ විට පෙනෙනුයේ පාරිභෝජන භාණ්ඩ සඳහා වූ කොටස 1983 දී සියයට 26 ක් ව තිබී 1984 දී සියයට 23 ක් දක්වා අඩුවී ඇති බවයි. ඒ අතර, අන්තර් භාණ්ඩවල කොටස සියයට 48 සිට සියයට 50 දක්වා වැඩි විය. ආයෝජන භාණ්ඩවල කොටස සියයට 27 සිට සියයට 26 දක්වා සුළු අඩුවීමක් පෙන්විය.